# ජාතික පශු සම්පත් ප්‍රතිපත්තිය

## ශ්‍රී ලංකාව

**පොහොසත් රටක් ලස්සන ජීවිතයක් උදෙසා පශු සම්පත් සංවර්ධනය**

**පශු සම්පත් අංශය**

# කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පශු සම්පත් අංශය ආහාර සුරක්ෂිතතාව, පෝෂණය, ග්‍රාමීය ජීවනෝපායන් සහ කෘෂිකාර්මික ආර්ථිකයට අගය එකතු කිරීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. නව රජය "පොහොසත් රටක් ලස්සන ජීවිතයක් උදෙසා පශු සම්පත් සංවර්ධනය" යන ජාතික ප්‍රතිපත්තිය තුළ පශු සම්පත් ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම මඟින් රට කිරි නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත වීම, පශු සම්පත් ජාන විද්‍යාව වැඩිදියුණු කිරීම, නිෂ්පාදන යටිතල පහසුකම් ශක්තිමත් කිරීම, පෞද්ගලික අංශයේ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම සහ පශු සම්පත් ව්‍යාප්ති සේවා ප්‍රතිසංස්කරණය කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කර ඇත. කෙසේ වුවත්, පසුගිය දශක දෙක තුළ, දේශගුණික විපර්යාසවල බලපෑම්, වෙළඳපල අස්ථාවරත්වය, ආහාර හිඟය, මෑතකදී හඳුනාගත් සතුන්ගෙන් මිනිසුන්ට බෝවන රෝග සහ වෙළඳපළ අවශ්‍යතාවයන් ඇතුළු සැලකිය යුතු ව්‍යුහාත්මක සහ සන්දර්භීය වෙනස්කම් මගින් නිර්මාණය කර ඇති නව අභියෝග හමුවෙයාවත්කාලීන කරන ලද ප්‍රතිපත්ති රාමුවක් අවශ්‍ය ව ඇත.

2006 ප්‍රතිපත්තිය පිළිබඳ සමාලෝචනය, ශ්‍රී ලංකාවේ පශු සම්පත් අංශයේ තිරසාර වර්ධනය සහ ඔරොත්තු දීමේ හැකියාව (resilience) තහවුරු කිරීම සඳහා විසඳිය යුතු තීරණාත්මක අඩුපාඩු කිහිපයක් හඳුනාගෙන ඇත. මෙයට සත්ත්ව ගොවිපළ කළමනාකරණයේදී දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව (climate resilience) ඇතුළත් වේ. විශේෂයෙන්ම සත්ත්ව ආහාර සුරක්ෂිතතාව, තාප ආතති කළමනාකරණය, ජලය ලබාගැනීමේ හැකියාව සහ ආපදා සූදානම වැනි අංශ මීට අදාළ වේ. මීට අමතරව, මිනිසා සහ සතුන් එක් සෞඛ්‍ය (One Health) ප්‍රවේශයක් ලෙස ක්‍රියා නොකිරීම සහ ජෛව ආරක්ෂණ රාමු සමඟ පශු සම්පත් සංවර්ධනය දුර්වල ලෙස ඒකාබද්ධ වීම මෙන්ම, පශු සම්පත් අගය දාමයන් ප්‍රමාණවත් තරම් දියුණු නොවීම සහ හඳුනා ගැනීමේ පද්ධති (traceability systems) ප්‍රමාණවත් නොවීම පවතී.

පශු සම්පත් අංශය නූතන තාක්ෂණයන් භාවිතයට ගැනීමේ අඩු බව, ඩිජිටල්කරණය සහ නවෝත්පාදනය සීමිත වීම, සහ කුඩා පරිමාණ ගොවීන් විධිමත් වෙළඳපොළවල් වෙත සම්බන්ධ කිරීම ප්‍රමාණවත් නොවීම වැනි අභියෝගවලට ද මුහුණ දෙයි. ප්‍රමිතියෙන් තොර සත්ත්ව ආහාර සහ අමුද්‍රව්‍ය, ප්‍රවේණි සහ අභිජනන ද්‍රව්‍ය (genetics and breeding materials) වල පවතින හිඟකම, පෞද්ගලික අංශයේ ආයෝජන ප්‍රමාණවත් නොවීම සහ ව්‍යාපාර සඳහා හිතකර පරිසරයක් නොමැතිකම යන සීමාවන් ක්ෂේත්‍රයේ සංවර්ධනය තවදුරටත් අඩාල කරයි. තවද, වත්මන් ප්‍රතිපත්ති රාමුව එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs), විකාශනය වන ගෝලීය වෙළඳ අවශ්‍යතා සහ තිරසාර ප්‍රමිතීන් සමඟ පවතින්නේ සීමිත අනුකූලතාවයකි.

මෙම අඩුපාඩු මඟහරවා ගැනීම සඳහා, කර්මාන්තයේ ප්‍රධාන පාර්ශවකරුවන්ගේ සක්‍රීය දායකත්වය ඇතිව අමාත්‍යාංශය විසින් මෙයට පෙර ජාතික කිරි සංවර්ධන ප්‍රතිපත්තිය (National Dairy Development Policy) සහ ජාතික කුකුළු පාලන සංවර්ධන ප්‍රතිපත්තිය (National Poultry

Development Policy) සකස් කිරීම සඳහා ප්‍රවේශයක් ගෙන තිබුණි. එහෙත් යාවත්කාලීන කරන ලද මෙම ජාතික පශු සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය තුළ එම සියලුම සත්ත්ව නිෂ්පාදන අංශ තනි, පුළුල් ප්‍රතිපත්ති රාමුවකට ඒකාබද්ධ කිරීම කර ඇත.

මෙම ප්‍රතිපත්තිය මඟින්, පශු සම්පත් සංවර්ධනය කිරීමේ අරමුණින් ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් පවතින සහ මතුවෙමින් පවතින අභියෝගවලට මුහුණ දීම සඳහා ඉලක්ක, ප්‍රතිපත්තිමය අරමුණු සහ ප්‍රතිපත්තිමය උපායමාර්ග දක්වා ඇත. ප්‍රතිපත්තිමය අරමුණු සමඟ අනුකූල වන ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාවලින් යුත් කුළුණු දහයක් මඟින් පශු සම්පත් අංශය මෙම ප්‍රතිපත්තිමය ඉලක්ක කරා මෙහෙයවයි.

**ප්‍රතිපත්තියේ විෂය පථය සහ අදාළත්වය**

මෙම ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ පශු සම්පත් අංශයේ තිරසාර සංවර්ධනය සහ කළමනාකරණය සඳහා ජාතික රාමුවක් සපයයි. මෙය දිවයින පුරා පශු සම්පත් නිෂ්පාදනය, සැකසීම, අලෙවිකරණය, පර්යේෂණ සහ සේවා සැපයීමේ නියැලී සිටින සියලුම පාර්ශවකරුවන්ට අදාළ වේ. මෙම ප්‍රතිපත්තිය රජයේ අමාත්‍යාංශ සහ ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතන, පෞද්ගලික අංශයේ ක්‍රියාකාරීන්, ගොවි සංවිධාන, පර්යේෂණ සහ අධ්‍යාපන ආයතන, සංවර්ධන හවුල්කරුවන් සහ තනි පුද්ගල පශු සම්පත් නිෂ්පාදකයින් සඳහා අදාළ වේ.

මෙම ප්‍රතිපත්තියේ විෂය පථය ආහාර නිෂ්පාදනයට සහ ග්‍රාමීය ජීවනෝපායන්ට දායක වන ගවයන්, මී ගවයන්, කුකුළන්, එළුවන්, බැටළුවන් සහ අනෙකුත් ගෘහාශ්‍රිත සතුන් ඇතුළු සියලුම ප්‍රධාන පශු සම්පත් උප අංශ ආවරණය කරයි. මෙමඟින් පෞද්ගලික අංශය මූලික කරගත් සංවර්ධනය, වෙළඳපොළ ඉලක්ක කරගත් තරඟකාරී නිෂ්පාදනය, තිරසාර සහ පරිසර හිතකාමී සංවර්ධනය, කුඩා පරිමාණ ගොවීන් සහ ග්‍රාමීය ජීවනෝපායන් සඳහා සහාය වීම, සහ විද්‍යාව හා තාක්ෂණය මත පදනම් වූ සංවර්ධනය වැනි ක්ෂේත්‍ර ආවරණය කරයි.

**දැක්ම:**

ජාතික පුනරුදය සඳහා නවීකරණය වූ සහ තිරසාර පශු සම්පත් ක්ෂේත්‍රයක් ගොඩ නැගීම.

**මෙහෙවර:**

පශු සම්පත් කර්මාන්තය ශක්තිමත්, තරඟකාරී සහ තිරසාර කර්මාන්තයක් බවට පත් කිරීම සඳහා, පවතින සියලුම සම්පත් තාක්ෂණික වශයෙන් නිවැරදි, සාමාජීය-ආර්ථික වශයෙන් පිළිගත හැකි සහ පරිසර හිතකාමී අයුරින් කළමනාකරණය කිරීම සහ උපරිම ලෙස භාවිත කිරීම මඟින් සියලුම පාරිභෝගික කණ්ඩායම් වෙත දැරිය හැකි මිලකට ආරක්ෂිත සහ පෝෂ්‍යදායී පශු සම්පත් නිෂ්පාදන සැපයීම, ජාත්‍යන්තර ඉල්ලුම සපුරාලීම සහ දේශීය ආර්ථිකයට දායක වීම.

**ඉලක්ක:**

01. ඵලදායිතාව වැඩිදියුණු කිරීම, සත්ත්ව ආහාර සම්පත් සහ ශක්තිමත් අගය දාමයන් හරහා අඛණ්ඩ ජාතික සැපයුම සහතික කිරීම සඳහා දේශීය කිරි, මස් සහ බිත්තර නිෂ්පාදනය ඉහළ නැංවීම.

02. ගොවිපළේ සිට පරිභෝජනය දක්වා අගය දාමයන් සහතිකකරණය ශක්තිමත් කිරීම මඟින්, ආරක්ෂිත සහ උසස් තත්ත්වයේ සත්ත්ව නිෂ්පාදන ඇති කිරීම.

03. කාර්යක්ෂම නිෂ්පාදන පද්ධති හරහා ගොවීන්ගේ ලාභදායිත්වය ඉහළ නංවමින් පාරිභෝගිකයින් සඳහා දැරිය හැකි මිල ගණන් පවත්වා ගැනීම.

04. දේශීය ජාන සම්පත් සංරක්ෂණය, වැඩිදියුණු කිරීම සහ තිරසාර ලෙස භාවිතා කිරීම.

05. චක්‍රීය ආර්ථික ප්‍රවේශයක් සහ ඉඩම්, ජලය සහ සත්ත්ව ආහාර යන සම්පත් කාර්යක්ෂමව භාවිත කිරීම තුළින්, පාරිසරික වශයෙන් තිරසාර සහ දේශගුණයට ඔරොත්තු දෙන (Climate-Resilient) පශු සම්පත් පද්ධති ප්‍රවර්ධනය කිරීම.

06. පශු සම්පත් නිෂ්පාදනය, සැකසීම සහ අලෙවිකරණය හරහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් ප්‍රවර්ධනය කිරීම සහ ආයෝජන වැඩි දියුණු කිරීම මඟින් ක්ෂේත්‍රයේ වර්ධනය සහ තරඟකාරිත්වය ඉහළ නැංවීම.

07. තරඟකාරී අපනයන වෙළඳපොළට ළඟා වීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීම සහ සහතිකකරණය ශක්තිමත් කිරීම මඟින් අපනයනය ඉලක්ක කරගත් පශු සම්පත් නිෂ්පාදනයට පහසුකම් සැලසීම.

**ප්‍රතිපත්ති අරමුණු:**

1. ඵලදායිතාව සහ ලාභදායී ගොවිතැන වැඩිදියුණු කිරීම මඟින් පාරිභෝගිකයන්ට දැරිය හැකි මිලකට ලබා ගත හැකි සතුන්ගෙන් ලබාගන්නා ආහාර සුලභකිරීම.

2. රට තුළ නිරෝගී සත්ත්ව ගහනයක් සහතික කිරීම සඳහා සත්ත්ව සෞඛ්‍යය හා යහපැවැත්ම වැඩිදියුණු කිරීම.

3. තිරසාර සත්ත්ව ආහාර සම්පත් සංවර්ධනය කිරීම, සත්ත්ව ආහාරවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ කාර්යක්ෂම පෝෂණ පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම මඟින් සත්ත්ව ආහාර සහ පෝෂණ කළමනාකරණය වැඩිදියුණු කිරීම.

4. දේශීය සහ වැඩිදියුණු කළ සත්ත්ව ආහාර වල ජානමය තත්වයන් වැඩිදියුණු කිරීම සහ සංරක්ෂණය සහ තිරසාර භාවිතය සඳහා ක්‍රමානුකූල අභිජනන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම.

5. ලාභදායී සහ නවීන පශු සම්පත් කර්මාන්තයක් සහතික කිරීම සඳහා නව්‍ය සහ දියුණු තාක්ෂණයන් හරහා අගය එකතු කිරීම වැඩි දියුණු කිරීම.

6. පශු සම්පත් ක්ෂේත්‍රය පුරා නිවැරදි තීරණ ගැනීම සඳහා, තත්‍ය කාලීන (real-time) දත්ත රැස් කිරීම, විශ්ලේෂණය සහ හුවමාරු කිරීම පහසු කිරීම පිණිස, ඒකාබද්ධ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) පදනම් කරගත් සත්ත්ව පාලන දත්ත කළමනාකරණ පද්ධති සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම.

7. ජීවනෝපාය සංවර්ධනයට සහ කර්මාන්ත තිරසාරභාවයට සහාය වීම සඳහා පශු සම්පත් නිෂ්පාදනයේ යෙදීමට කාන්තාවන් සහ තරුණයින් බල ගැන්වීම.

8. දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ පාරිභෝගික විශ්වාසය, නිෂ්පාදන හඳුනාගැනීම සහ තරඟකාරීත්වය ඉහළ නැංවීම සඳහා ශක්තිමත් නිෂ්පාදන සන්නාමකරණ උපාය මාර්ග සංවර්ධනය කිරීම සහ වෙළඳපොළ ප්‍රවේශය වැඩි දියුණු කිරීම.

9. චක්‍රීය ආර්ථික ප්‍රවේශයක් හරහා පශු සම්පත් අතුරු නිෂ්පාදන භාවිතය ප්‍රශස්ත කිරීම.

10. තිරසාර හා දේශගුණයට ඔරොත්තු දෙන පශු සම්පත් නිෂ්පාදනය සහතික කිරීම සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන් සහ අන්තර් ආයතනික සහයෝගීතාවය තුළින් නව්‍ය, වෙළඳපොළ මූලික කර ගත් පර්යේෂණ සහ සංවර්ධනය සඳහා වන ආයෝජන වෙනුවෙන් පහසුකම් සැලසීම.

11. පශු සම්පත් අංශයේ විකාශනය වන ජාතික හා ජාත්‍යන්තර අවශ්‍යතා සපුරාලීම සඳහා මානව සහ යටිතල පහසුකම් ධාරිතාවන් ශක්තිමත් කිරීම.

12. පශු සම්පත් අංශයේ උන්නතිය සඳහා අන්තර් ආයතනික සම්බන්ධීකරණය, යහපාලනය සහ නියාමන රාමුව වැඩිදියුණු කිරීම.

**උපාය මාර්ග**

**අරමුණ 1 - ඵලදායිතාව සහ ලාභදායී ගොවිතැන වැඩිදියුණු කිරීම මඟින් දැරිය හැකි මිලකට ලබා ගත හැකි සතුන්ගෙන් ලබාගන්නා ආහාර සුලභකිරීම.**

1.1. දේශගුණික ඔරොත්තු දීමේ ක්‍රියාමාර්ග තුළින් ඉල්ලුමට සැහෙන පශු සම්පත් නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම.
1.2. අපනයනය ඉලක්ක කරගත් දේශීය නිෂ්පාදනය දිරිමත් කිරීම
1.3. අනුග්‍රාහක මූල්‍ය ප්‍රතිපත්තියක් හරහා සෞඛ්‍ය සම්පන්න තරඟකාරීත්වයක් සහ සාධාරණ වෙළඳාමක් සඳහා සක්‍රීය ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම.
1.4. රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය දිරිමත් කිරීම.
1.5. පශු සම්පත් ව්‍යවසායන්හි තිරසාර වර්ධනයට සහාය වීම සඳහා මූල්‍ය, තාක්ෂණය, ව්‍යාප්ති සහ යටිතල පහසුකම් සඳහා සාධාරණ ප්‍රවේශයක් ලබා දීම.
1.6. පශු සම්පත් රක්ෂණ යෝජනා ක්‍රමය සංවර්ධනය සහ භාවිතය ප්‍රවර්ධනය කිරීම.

**අරමුණ 2 - රට තුළ නිරෝගී සත්ත්ව ගහනයක් සහතික කිරීම සඳහා සත්ත්ව සෞඛ්‍යය හා යහපැවැත්ම වැඩිදියුණු කිරීම.**

2.1. බෝවන රෝග සහ සත්වයාගෙන් මිනිසාට බෝවන (zoonotic) රෝග ව්‍යාප්තිය අවම කිරීම සඳහා රෝග ආවේක්ෂණය, වැළැක්වීම සහ පාලන ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම.

2.2. සත්ත්ව සෞඛ්‍යය සහතික කිරීම සඳහා ජාතික හා කලාපීය මට්ටමින් රසායනාගාර, රෝග විනිශ්චය, ප්‍රතිකාර සහ මානව සම්පත් ඇතුළු යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.

2.3. රාජ්‍ය හා පෞද්ගලික ආයතන සමඟ සම්බන්ධ වෙමින් තත්‍ය කාලීන රෝග වාර්තාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම.

2.4. දේශසීමා පාලනය සඳහා පහසුකම් වැඩි දියුණු කිරීම

2.5. එක් සෞඛ්‍ය (one health) ප්‍රවේශයක් යටතේ ඵලදායී පශු මහජන සෞඛ්‍ය සේවාවක් ක්‍රියාත්මක කිරීම.

2.6. යහපත් සත්ත්ව පාලන පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම සඳහා ගොවිපල තක්සේරු යාන්ත්‍රණ හඳුන්වා දීම.

2.7. ක්ෂුද්‍ර ජීවී නාශක ඇතුළු පශු ඖෂධ විචක්ෂණශීලීව භාවිතා කිරීම සහතික කිරීම.

**අරමුණ 3 - තිරසාර ආහාර සම්පත් සංවර්ධනය කිරීම, ආහාරවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ කාර්යක්ෂම පෝෂණ පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම මඟින් ආහාර සහ පෝෂණ කළමනාකරණය වැඩිදියුණු කිරීම.**

3.1. පශු සම්පත් නිෂ්පාදනය සඳහා උසස් තත්ත්වයේ සහ පෝෂ්‍යදායී සත්ත්ව ආහාර සහ ආහාර අමුද්‍රව්‍ය වසර පුරා ලබා ගැනීම සහතික කිරීම.

3.2. පශු සම්පත් සඳහා දේශීය තෘණ (pasture), පෝෂක ආහාර (fodder) සහ සාන්ද්‍ර ආහාර (concentrates) අමුද්‍රව්‍ය නිෂ්පාදනය උදෙසා පර්යේෂණාගාර පහසුකම් ඇතුළු යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.

3.3. සත්ත්ව ආහාර නිෂ්පාදනයට හිතකර වන පරිදි අදාළ ප්‍රතිපත්ති සහ රෙගුලාසි සඳහා පහසුකම් සැලසීම.

3.4. සත්ත්ව ආහාර සහතික කිරීමේ ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා රසායනාගාර පහසුකම් සහ මානව සම්පත් ඇතුළු යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.

3.5. සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා යටිතල පහසුකම්, දියුණු තාක්ෂණය වැඩි දියුණු කිරීම.

**අරමුණ 4- දේශීය සහ වැඩිදියුණු කළ සත්ව ආහාර වල ජානමය වැඩිදියුණු කිරීම සහ සංරක්ෂණය සහ තිරසාර භාවිතය සඳහා ක්‍රමානුකූල අභිජනන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම.**

4.1. රටට හිතකර සත්ත්ව අභිජනන ප්‍රතිපත්තිය ශක්තිමත් කිරීම.
4.2. ජාන විද්‍යාවේ දියුණුව තුළින් පශු සම්පත් ඵලදායිතාව වැඩි කිරීම.
4.3. ඵලදායී ජාතික පශු සම්පත් අභිජනන වැඩසටහන් සඳහා මානව සම්පත් ඇතුළු යටිතල පහසුකම් ශක්තිමත් කිරීම.
4.4. ආහාර පිණිස ඇති කරනු ලබන දේශීය සත්ව ආර බාහිර සහ ස්ථානීය සංරක්ෂණය
4.5. ප්‍රජනක ආබාධ සඳහා ප්‍රතිකාර කිරීම සඳහා පහසුකම් ශක්තිමත් කිරීම.

**අරමුණ 5- ලාභදායී සහ නවීන පශු සම්පත් කර්මාන්තයක් සහතික කිරීම සඳහා නව්‍ය සහ දියුණු තාක්ෂණයන් හරහා අගය එකතු කිරීම වැඩි දියුණු කිරීම.**

5.1. නවීන තාක්ෂණයන් හඳුන්වා දීම මගින් අගය එකතු කළ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම.
5.2. ජාතික හා ජාත්‍යන්තර ඉල්ලුමට සරිලන පරිදි ආරක්ෂිත සහ ගුණාත්මක අගය එකතු කළ නිෂ්පාදනය සහතික කිරීම.
5.3. අගය එකතු කළ නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහ සෞඛ්‍යාරක්ෂිතබව සහතික කිරීම සඳහා නීති ශක්තිමත් කිරීම.
5.4. අගය එකතු කිරීමේදී පෞද්ගලික අංශයේ සහභාගීත්වය සඳහා පහසුකම් සැලසීම.

**අරමුණ 6 – පශු සම්පත් ක්ෂේත්‍රය පුරා දැනුවත් තීරණ ගැනීම සඳහා, තත්‍ය කාලීන (real-time) දත්ත රැස් කිරීම, විශ්ලේෂණය සහ හුවමාරු කිරීම පහසු කිරීම පිණිස, ඒකාබද්ධ ඩිජිටල්කරණය කළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) පදනම් කරගත් සත්ත්ව පාලන දත්ත කළමනාකරණ පද්ධති සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම.**

6.1. තොරතුරු තාක්ෂණ පාදක කර ගත් පශු සම්පත් දත්ත කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම.

**අරමුණ 7- ජීවනෝපාය සංවර්ධනයට සහ කර්මාන්ත තිරසාරභාවයට සහාය වීම සඳහා පශු සම්පත් නිෂ්පාදනයේ යෙදීමට කාන්තාවන් සහ තරුණයින් බල ගැන්වීම.**

7.1. දරිද්‍රතාවය පිටුදැකීම සහ ආර්ථික වර්ධනය සඳහා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන
7.2. කාන්තාවන් සහ තරුණයින් සවිබල ගැන්වීම සඳහා රජයේ සහාය සහිත වැඩසටහන

**අරමුණ 8 - දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ පාරිභෝගික විශ්වාසය, නිෂ්පාදන හඳුනාගැනීම සහ තරඟකාරීත්වය ඉහළ නැංවීම සඳහා ශක්තිමත් නිෂ්පාදන සන්නාමකරණ උපාය මාර්ග සංවර්ධනය කිරීම සහ වෙළඳපොළ ප්‍රවේශය වැඩි දියුණු කිරීම.**

8.1. වෙළඳපොළ ප්‍රවණතා තක්සේරු කර ප්‍රකාශයට පත් කිරීම සඳහා අන්තර් ආයතනික යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

8.2. පශු සම්පත් නිෂ්පාදන සන්නාමකරණය සඳහා යාන්ත්‍රණයක් හඳුන්වා දීම.

8.3. වෙළඳපොළ ප්‍රවේශය ලබා ගැනීම සඳහා ගොවි සමිති සහ සමුපකාර පිහිටුවීමට කුඩා පරිමාණ නිෂ්පාදකයින් දිරිමත් කිරීම.

8.4. අපනයන වෙළඳපොළ අවස්ථා සඳහා උපායමාර්ගික වෙළඳ සම්බන්ධතා සහ ද්විපාර්ශ්වික හෝ බහුපාර්ශ්වික සහයෝගීතා ප්‍රවර්ධනය කිරීම.

8.5. බදු සහන සහ ගැලපෙන මූල්‍ය උපකරණ සඳහා ප්‍රවේශය පහසු කිරීම.

8.6. නිෂ්පාදන ලුහුබැඳීමේ පද්ධතියක් හඳුන්වා දීම.

**අරමුණ 9 - චක්‍රීය ආර්ථික ප්‍රවේශයක් හරහා පශු සම්පත් අතුරු නිෂ්පාදන භාවිතය ප්‍රශස්ත කිරීම.**

9.1. පශු සම්පත් අතුරු නිෂ්පාදන භාවිතය ප්‍රවර්ධනය කිරීම

9.2. පුනර්ජනනීය නව නිෂ්පාදන සඳහා වෙළඳපොළ ප්‍රවේශය නිර්මාණය කිරීම

9.3. අතුරු නිෂ්පාදන සඳහා තත්ත්ව සහතික පද්ධතියක් හඳුන්වා දීම.

**අරමුණ 10 - තිරසාර හා දේශගුණයට ඔරොත්තු දෙන පශු සම්පත් නිෂ්පාදනය සහතික කිරීම සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන් සහ අන්තර් ආයතනික සහයෝගීතාවය තුළින් නව්‍ය, වෙළඳපොළ මූලික කර ගත් පර්යේෂණ සහ සංවර්ධනය සඳහා වන ආයෝජන වෙනුවෙන් පහසුකම් සැලසීම.**

10.1. පශු පර්යේෂණ මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම සඳහා ජාතික උපදේශක කමිටුවක් පිහිටුවීම.

10.2. පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා රාජ්‍ය-පෞද්ගලික අන්තර් ආයතනික සහයෝගීතාව ශක්තිමත් කිරීම.

10.3. පර්යේෂණ සොයාගැනීම් හෝ නිමැවුම් (deliverables) පරිශීලකයන්, පාරිභෝගිකයන් හෝ ආයෝජකයන් වෙත ව්‍යාප්ත කිරීම සඳහා ජාතික වේදිකාවක් පිහිටුවීම.

10.4. රටේ අවශ්‍යතාවය සපුරාලීම සඳහා අදාළ කර්මාන්ත පාදක කර ගත් පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.

10.5. ජාත්‍යන්තර සහයෝගීතාව වැඩි දියුණු කිරීම.

10.6. පර්යේෂණ නිමැවුම් කාර්මිකකරණය සඳහා ආයෝජන දිරිමත් කිරීම.

**අරමුණ 11 - පශු සම්පත් අංශයේ විකාශනය වන ජාතික හා ජාත්‍යන්තර අවශ්‍යතා සපුරාලීම සඳහා මානව සහ යටිතල පහසුකම් ධාරිතාවන් ශක්තිමත් කිරීම.**

11.1. පශු සම්පත් නිෂ්පාදනය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රජයෙන් සහ බාහිර පරිත්‍යාගශීලීන්ගෙන් මූල්‍යමය සහයෝගය ලබා ගැනීම.

11.2. පශු සම්පත් අංශයේ සියලුම ස්ථරවල වෘත්තීය හා කුසලතා සපිරි ශ්‍රම බලකාය වැඩි දියුණු කිරීම.

11.3. පශු සම්පත් ව්‍යාප්ති සේවාව ශක්තිමත් කිරීම.

**අරමුණ 12 - පශු සම්පත් අංශයේ උන්නතිය සඳහා අන්තර් ආයතනික සම්බන්ධීකරණය, යහපාලනය සහ නියාමන රාමුව වැඩිදියුණු කිරීම.**

12.1. අදාළ අංශ අතර ප්‍රතිපත්ති සහ ඒවා බලාත්මක කිරීම් යාවත්කාලීන කර අනුකූලතාව ඇති කිරීම.

12.2. රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පශු සම්පත් ක්ෂේත්‍රය ප්‍රමුඛතා අංශයක් ලෙස සහතික කිරීම.

12.3. ගුණාත්මක හා ආරක්ෂිත පශු සම්පත් නිෂ්පාදනය සහ නිෂ්පාදන සහතික කිරීම සඳහා පවතින නියාමන රාමුව වැඩිදියුණු කිරීම.

12.4. පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම සහ වරින් වර බලපෑම් තක්සේරු කිරීම.

**ප්‍රතිපත්ති අරමුණු සමඟ අනුකූල වන ප්‍රතිපත්ති ප්‍රමුඛතා දහයක් හඳුනාගෙන ඇත.**

1. වෙළඳපොළ පද්ධති, අගය දාම, සැකසුම් සහ චක්‍රීය ආර්ථිකය
2. ජාන විද්‍යාව, අභිජනනය සහ පට්ටි ඵලදායිතාව
3. ආහාර සුරක්ෂිතතාව, ආහාර, ඉඩම් සහ පෝෂණය
4. සත්ව සෞඛ්‍යය සහ යහපැවැත්ම
5. පශු සම්පත් සහ කුකුළු පාලනය ඩිජිටල්කරණය සහ දත්ත යටිතල පහසුකම්
6. පශු සම්පත් මූල්‍ය, රක්ෂණ සහ බැංකුකරණ හැකියාව
7. ව්‍යවසායකත්වය, ධාරිතා සංවර්ධනය, ව්‍යාප්ති සහ අන්තර්ගතික වාණිජකරණය
8. ප්‍රමිති, ආහාර සුරක්ෂිතතාව සහ සහතික කිරීම
9. ආයෝජන, රාජ්‍ය පුද්ගලික හවුල්කාරීත්වය, පර්යේෂණ සහ නවෝත්පාදන හවුල්කාරිත්වයන්
10. අංශ කාර්ය සාධන කළමනාකරණය, නිරීක්ෂණය සහ ඇගයීම සහ උපායමාර්ගික ඉලක්ක

**1 වන කුළුණ: වෙළඳපොළ පද්ධති, අගය දාම, සැකසුම් සහ චක්‍රීය ආර්ථිකය**

අගය එකතු කිරීම, ශීතාගාර දාමය, සැකසුම් යටිතල පහසුකම්, ගබඩා කිරීම, ඝාතකාගාර නවීකරණය සහ පශු සම්පත් අතුරු නිෂ්පාදන වක්‍රීයව භාවිතා කිරීම ඇතුළුව පශු සම්පත් අගය දාමය පුරා වෙළඳපොළ පද්ධති වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම. වෙළඳපල සහභාගීත්වය, විධිමත් සැකසුම්, අතුරු නිෂ්පාදන භාවිතය සහ පෞද්ගලික ආයෝජන සක්‍රීය කිරීම සඳහා නීති සහ රීති සමාලෝචනය කිරීම මෙයට ඇතුළත් විය යුතුය.

**අරමුණු 1, 2, 3, 4, 5, 8, 9, සහ 12.**

**2 වන කුළුණ: ජාන විද්‍යාව, අභිජනනය සහ පට්ටි ඵලදායිතාව**

පුළුල් සහ වඩා හොඳින් නියාමනය කරන ලද කෘතිම සිංචන, වැඩිදියුණු කළ අභිජනන සේවා, තෝරාගත් ගොනුන් සහ වැස්සියන් හරහා ජානමය වැඩිදියුණු කිරීම සහ පට්ටි ඵලදායිතාව වැඩිදියුණු කිරීමට දායක වීම. කළල හුවමාරුව සහ ජානමය තේරීමේ තාක්ෂණයන් ඇතුළු අනෙකුත් ප්‍රජනන තාක්ෂණයන්, ජාතික පට්ටි සැලසුම් කිරීම, දේශීය ආරයන් සංරක්ෂණය සහ අභිජනන දත්ත පද්ධති සඳහා ද සහාය වීම.

**අරමුණු 1, 3, 4 6, සහ 11.**

**3 වන කුළුණ: ආහාර සුරක්ෂිතතාව, ආහාර, ඉඩම් සහ පෝෂණය**

ගෘහස්ථ සත්ව ආහාර සහ ආහාර සම්පත් පුළුල් කිරීම, ආහාර නිෂ්පාදනය සඳහා ඉඩම් නිදහස් කිරීම, ආහාර ගබඩා කිරීම සහ සංරක්ෂණය වැඩිදියුණු කිරීම, ආහාර සැකසීම සහ ආහාර තාක්ෂණයන්ට සහාය වීම, ආහාර ආරක්ෂණ ප්‍රමිතීන් ශක්තිමත් කිරීම සහ ආනයනික ආහාර අමුද්‍රව්‍ය මත යැපීම අඩු කිරීම මගින් ආහාර සුරක්ෂිතතාවය, ගුණාත්මකභාවය, දැරිය හැකි මිල සහ පෝෂණ කළමනාකරණය වැඩිදියුණු කිරීම. විශේෂයෙන් ඌන උපයෝජිත ඉඩම් ඇති විට ගෘහස්ථව ආහාර වගා කිරීම සහ සත්ත්ව නිවාස සඳහා පශු සම්පත් අංශයේ ඉඩම් අවශ්‍යතා සමාලෝචනය කිරීම.

**අරමුණු 1, 3, 5, 10, සහ 12.**

**4 වන කුළුණ: සත්ත්ව සෞඛ්‍යය සහ යහපැවැත්ම**

සෞඛ්‍ය සම්පන්න ජාතික පට්ටියක් සහ රැළක් පවත්වා ගැනීම, රෝගවලින් සිදුවන පාඩු අවම කිරීම, මහජන සෞඛ්‍යය ආරක්ෂා කිරීම සහ දේශීය හා අපනයන වෙළඳපොළ සඳහා ආරක්ෂිත, උසස් තත්ත්වයේ පශු සම්පත් නිෂ්පාදන සඳහා සහාය වීම සඳහා ශ්‍රී ලංකාවේ සත්ත්ව සෞඛ්‍ය කළමනාකරණ පද්ධති ශක්තිමත් කිරීම. මෙයට වැඩිදියුණු කළ රෝග ආවේක්ෂණ, වැළැක්වීම සහ පාලනය ඇතුළත් වේ; ජාතික සහ කලාපීය රෝග විනිශ්චය රසායනාගාර ධාරිතාව ශක්තිමත්වීම; තත්‍ය කාලීන රෝග වාර්තාකරණය; පශු සම්පත් සහ කුකුළු ගොවිපල සඳහා ජෛව ආරක්ෂණ මාර්ගෝපදේශ; ශක්තිමත් නිරෝධායනය සහ දේශසීමා පාලනය; සහ එක් සෞඛ්‍ය (One Health)

ප්‍රවේශය හරහා පශු මහජන සෞඛ්‍ය සේවා ක්‍රියාත්මක කිරීම. සතුන්ගේ ශාරීරික හා මානසික යහපැවැත්ම සහතික කිරීම සඳහා වන යහපත් සත්ත්ව පාලන පිළිවෙත්.

මෙම කුළුණ ඩිජිටල්කරණ න්‍යාය පත්‍රයට සමීපව සම්බන්ධ කළ යුතුය.

**අරමුණු 1, 2, 5, 6, 8, 11, සහ 12.**

**5 වන කුළුණ: පශු සම්පත් සහ කුකුළු පාලනය ඩිජිටල්කරණය සහ දත්ත යටිතල පහසුකම්**

- අගය දාමය ඩිජිටල්කරණය.
- සතුන් හඳුනාගැනීමේ සහ පසුප්‍රවේශන පද්ධතිය (AITS), සතුන්, හිමිකරුවන්, ගොවිපලවල්, සෞඛ්‍ය වාර්තා, අභිජනනය, ඵලදායිතාව, චලනය, කිරි එකතු කිරීම, ඝාතකාගාර දත්ත, සහතික කිරීම, වෙළඳපල තොරතුරු සහ පසුප්‍රවේශන හැකියාව ආදිය සම්බන්ධ කරමින් මූලික යටිතල පහසුකම් ස්ථරය ලෙස පැවතීම. සෑම විශේෂයකටම එහි නිෂ්පාදන පද්ධතියට සුදුසු මොඩියුල තිබිය යුතු අතර, පොදු හඳුනාගැනීමේ සහ අන්තර් ක්‍රියාකාරීත්ව රාමුවක් පැවතිය යුතුය.
- කෘත්‍රිම බුද්ධිය මගින් සහාය දක්වන ව්‍යාප්ති සේවාවක් සංවර්ධනය කිරීම.

**අරමුණු 6 සහ 1, 2, 4, 8, සහ 12**

**6 වන කුළුණ: පශු සම්පත් මූල්‍ය, රක්ෂණ සහ බැංකුකරණ හැකියාව**

සතුන්, ගොවිපලවල් සහ අගයදාම ව්‍යවසායන් වඩාත් බැංකුකරණය කිරීම සඳහා පශු සම්පත් දත්ත, AITS සහ ඵලදායිතා වාර්තා භාවිතා කිරීමෙන් අඩු වියදම් ණය, රක්ෂණ සහ ආයෝජන විවෘත කිරීම. මෙයට කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ ව්‍යවසායකයින් සඳහා සහනදායී ණය, රක්ෂණ ක්‍රම, ආහාර සහ යෙදවුම් සඳහා කාරක ප්‍රාග්ධනය සහ වාණිජ ගොවිපලවල්, සැකසුම් සහ ශීත දාම යටිතල පහසුකම් සඳහා මහා පරිමාණ මූල්‍යකරණය ඇතුළත් විය යුතුය.

**අරමුණු 1, 2, 5, 6, 7, 10, සහ 12.**

**7 වන කුළුණ: ව්‍යවසායකත්වය, ධාරිතා සංවර්ධනය, ව්‍යාප්ති සහ අන්තර්ගතික වාණිජකරණය**

වෘත්තීයවේදීන් සහ තාක්ෂණික කාර්ය මණ්ඩලය සඳහා ධාරිතා සංවර්ධනය, පුහුණුව, ව්‍යාප්ති සේවා, ව්‍යාපාර සංවර්ධන සහාය, මූල්‍ය සාක්ෂරතාවය, නිරූපණ ගොවිපලවල්, ඩිජිටල් උපදේශන සේවා, වෙළඳපල සම්බන්ධතා සහ ඉඩම්, ආහාර සහ මූල්‍ය සඳහා ප්‍රවේශය තුළින් කාන්තාවන්, තරුණයින් සහ සුළු පරිමාණ ගොවීන් යැපුම් පශු සම්පත් ක්‍රියාකාරකම් වල සිට වාණිජමය වශයෙන් ශක්‍යතාවය සහිත පශු සම්පත් ව්‍යවසායන් කරා යාමට දිරිමත් කිරීම.

**අරමුණු 1, 5, 6, 7, 10, සහ 11.**

**8 වන කුළුණ: ප්‍රමිති, ආහාර සුරක්ෂිතතාව සහ සහතික කිරීම**

පශු සම්පත් අගය දාමය පුරා ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්, ආහාර සුරක්ෂිතතා පද්ධති, සහතික කිරීමේ යාන්ත්‍රණ සහ සත්ත්ව සෞඛ්‍ය ආරක්ෂණ ස්ථාපිත කර බලාත්මක කිරීම. මෙයට කිරි, මස් සහ බිත්තර ප්‍රමිතීන්, අගය එකතු කළ නිෂ්පාදන සහ සත්ත්ව අතුරු නිෂ්පාදන ඇතුළත් විය යුතුය. ඊට අමතරව, ශීත කිරීමේ මධ්‍යස්ථාන නියාමනය, තත්ත්ව පරීක්ෂාව, ක්ෂුද්‍ර ජීවී නාශක ප්‍රතිරෝධය /අවශේෂ පරීක්ෂාව, බිත්තරවල සනීපාරක්ෂාව, ඝාතකාගාර ප්‍රමිතීන්, ජෛව ආරක්ෂාව, රෝග ආවේක්ෂණ සහ පසුප්‍රවේශන හැකියාව මත පදනම් වූ සහතික කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

**අරමුණු 1, 2, 5, 8, සහ 12**

**9 වන කුළුණ: ආයෝජන, රාජ්‍ය පුද්ගලික හවුල්කාරීත්වය, පර්යේෂණ සහ නවෝත්පාදන හවුල්කාරිත්වයන්**

විශ්ව විද්‍යාල, පර්යේෂණ ආයතන, තාක්ෂණ සමාගම්, පරිත්‍යාගශීලීන්, බහුපාර්ශ්වික සංවර්ධන බැංකු සහ ජාත්‍යන්තර විශේෂඥයින් සමඟ සම්බන්ධතා ඇතුළුව රාජ්‍ය ආයෝජන, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන් සහ නවෝත්පාදන හවුල්කාරිත්වයන් හරහා ආයෝජන වැඩි කිරීම. ප්‍රාග්ධනය එක්රැස් කිරීමට පමණක් නොව, අගය දාමය පුරා තාක්ෂණය, පර්යේෂණ, සේවා සැපයුම් ආකෘති සහ කළමනාකරණ විශේෂඥතාව හඳුන්වා දීමට ද රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන් භාවිතා කළ යුතුය.

**අරමුණු 1, 5, 10, 11, සහ 12.**

**10 වන කුළුණ: අංශ කාර්ය සාධන කළමනාකරණය, නිරීක්ෂණය සහ ඇගයීම සහ උපායමාර්ගික ඉලක්ක**

අන්තර් ආයතනික සම්බන්ධීකරණය සහ සහයෝගීතාවයන් තුලින් ප්‍රගතිය නිරීක්ෂණය කිරීම, බාධක හඳුනා ගැනීම සහ පාඨමාලා නිවැරදි කිරීම සඳහා සහාය වීම සඳහා මධ්‍යගත දත්ත, උපකරණ පුවරු, නිරීක්ෂණය සහ ඇගයීම, වෙළඳපල බුද්ධිය සහ උපායමාර්ගික ඉලක්ක සහිත ජාතික කාර්යසාධන කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම. මෙයට නිෂ්පාදන ඉලක්ක, පට්ටි ප්‍රමාණයේ ඉලක්ක, ඵලදායිතා දර්ශක, ආහාර දර්ශක, සත්ත්ව සෞඛ්‍ය දර්ශක, මූල්‍ය

අවශෝෂණය, වෙළඳපල මිල ගණන්, ගුණාත්මක අනුකූලතාව සහ ආයෝජන ප්‍රවාහ ඇතුළත් විය යුතුය.

**අරමුණු 1, 6, 10 සහ 12**

**යොමුව**

1. පශු සම්පත් ප්‍රතිපත්තිය - 2006
2. කෙටුම්පත් කරන ලද කිරි නිෂ්පාදන ප්‍රතිපත්තිය - 2023
3. කෙටුම්පත් කරන ලද කුකුළු නිෂ්පාදන ප්‍රතිපත්තිය - 2024